කවරයේ කතාව

# පරිසරයත් ඔබත් ලෙඩ කරන කැලිකසළ




රංජිත් වීරවර්ධන

ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, සත්ත්ව විද්‍යා අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.


**කැලිකසළ පිළිබඳ ප්‍රශ්නය වර්තමානය වන විට ගැටලු ගණනාවකට හේතු වී ඇති දැඩි ව්‍යසනයක් බවට පත් වී තිබේ. අපේ රටේ පමණක් නොව වෙනත් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවලට ද මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් සෙවීම පිළිබඳ ගැටළු මතු වී ඇති බව පෙනේ.**

කැලිකසළ අර්බුදය මෙතරම් බරපතල තත්ත්වයකට පත්වීම සම්බන්ධයෙන් අප සියලු දෙනාම වගකිව යුතුයි. අපගේ එදිනෙද පාරිභෝගික අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේදී ඉවතලන අපද්‍රව්‍ය දිනෙන් දින කැලිකසළ හැටියට එකතු වේ.

නිවසෙත් හෝ කර්මාන්ත ශාලාවෙන් හෝ එකතු වන කැලිකසළ නැවත අපටම තර්ජනයක් වන බව බොහෝ දෙනෙකුට දැනටමත් අමතකව ගොසිනි. ඇත්තෙන්ම අද අප මුහුණදී තිබෙන පාරිසරික හා සෞඛ්‍ය ගැටළු බොහොමයකට හේතු වී ඇත්තේ අප විසින්ම ඉවතලන අපද්‍රව්‍ය බව අමුතුවෙන් කිවයුතු නොවේ.

අප ජීවත්වන ගෙවත්ත ගැන සිතන්න. එය පිරිසිදුව, ලස්සනට තබා ගන්න කවුරුත් කැමැතියි. මේ නිසා නිවෙසින්, ගෙවත්තෙන් එකතුවන සියලුම අපද්‍රව්‍ය එකතුකර අල්ලපු වත්තට හෝ මහපාරට මුදා හරිමු. නමුත් අපේම වරදින් අක්‍රමවත්ව සිදුවන කැලිකසළ බැහැරලීම අද පරිසරයට දැඩි තර්ජනයක් එල්ල කර තිබේ.

පිළිබඳ විවිධ මත ඉදිරිපත් කළ ද තවමත් පෙර ලෙසම කොළඹ නගරයේ විවිධ ස්ථානයන්හි කසළ කඳු දක්නට ලැබේ.

මෙසේ ඝන අපද්‍රව්‍ය නිසා ගොඩබිම අපිරිසුදු වීම හා දූෂණයවීම සිදුවෙන අතර ජල දූෂණය ද සිදුවේ. කොළඹ නගරය පුරා ඇති කාණු පද්ධතියට හා ඇළ මාර්ග පද්ධතියට මෙම අපද්‍රව්‍ය මුදා හැරීම මෙයට හේතුවයි. මෙහි දී පැල්පත් ආශ්‍රිතව ඇති ඇළ මාර්ග පද්ධතිය අපවිත්‍රවීමේ වේගය වැඩි බව දැකිය හැකිය. නිවෙසේ පරිහරණය කරන සියලු අපද්‍රව්‍ය කාණු පද්ධතියටත් ඉන් පසු ඇළ මාර්ගවලටත් මුදා හැරීමෙන් මෙසේ සිදුවේ. මීට අමතරව කොළඹ නගරයේ ඇති බොහෝ ඉන්ධන පිරවුම්හල්වලින් නිකුත් කරන අපද්‍රව්‍ය ද මෙම ඇළ මාර්ගවලට මුදා හැරේ. එමෙන්ම සමහර කර්මාන්තශාලා ද මෙම වැරැද්ද සිදු කරයි. මේ සඳහා සකස් කළ නව නීති කෙටුම්පත් තවමත් සම්මත නොවීම මෙවැනි ක්‍රියාවන්හි යෙදෙන වැරැදිකරුවන්ට නිදැල්ලේ සිටීමට හේතු වී ඇත. ජල අපවිත්‍රතාව නිසා පරිසර දූෂණය වීම රෝග පැතිර යාම මෙන්ම භූගත ජල දූෂණය ද ඉතා ඉක්මනින් සිදුවේ. නමුත් ජනතාව දැනුවත් නොවීම හෝ ක්‍රියාත්මක නොවීම නිසා මෙම තත්ත්වය උග්‍රවනු ඇත.

කොළඹ නගරයේ ඇති වැල්ලවත්ත, දෙහිවල, බොල්ගොඩ, දෙමටගොඩ, ශාන්ත සෙබස්තියන් වැනි ඇළ මාර්ග මෙසේ අපවිත්‍රකරණයට ලක් වූ ප්‍රධාන ස්ථාන වේ. ගොඩබිම පවිත්‍ර කිරීමට වඩා දුෂ්කර කාර්යයක් වූ මෙම ජල මාර්ග පවිත්‍රකරණයට විශාල මුදලක් ද වැයවේ. මේ නිසා රාජ්‍ය අංශයට ඒ සඳහා මුදල් වෙන් කිරීම ද අපහසු වී ඇත.

තමා වැරැද්ද කළ ද රජයේ යුතුකම මේ සියල්ල පිරිසුදු කිරීම බව ජනතාව සිතනතාක් මෙම පවිත්‍ර කිරීමේ කාර්යය සාර්ථක වන්නේ ද නැත. ඒනිසා අනිවාර්යයෙන්ම ජනතාව ද තමන් ජීවත්වන නිවෙස පිරිසුදු කිරීම සඳහා කරන කැප කිරීමට සමාන වූ කැප කිරීමක් තම නගරය පිරිසුදුව තබා ගැනීමට ද කළ යුතු වේ.

කොළඹ නගරය ප්‍රධාන කර ගනිමින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන නගරවල තත්ත්වය ද මෙයට වඩා වෙනස් නොවේ. නගර පවිත්‍ර කිරීමේ කාර්යය හා වගකීම නගර සභාවට අයිති දෙයක් වුව ද ජනතාවත් ඒ සඳහා විශාල සහයෝගයක් ලබාදිය යුතුයි. ජනතාව හා ආයතනය අතර බැඳීම වර්ධනය කර ගැනීමෙන් මෙම කාර්යය විධිමත්ව සිදුකර ගත හැකියි. තමන් ජීවත්වන, තමන් සුරක්ෂිත වන ස්ථානය සුරක්ෂිත කිරීමට නීති රීති අවශ්‍ය නොවේ. තමාට මෙන්ම සියලු සත්ත්වයන්ට, පරිසරයටත් ආදරය කිරීමෙන් මෙම පරිසර හානිය, සමාජ ව්‍යසනය ඉතා කෙටි කාලයක් තුළ ජය ගැනීමට හැකිවෙනු ඇත. ඒ සඳහා සියලු දෙනාගේ සහාය අත්‍යවශ්‍ය වේ.

පරිසරය කියූ විට එය මුළු හතරකින් වටවුණු ඉඩමකට, ගෙවත්තකට සීමා නොවේ. මේ මහපොළොව මත ඇති හැම දෙයක්ම පරිසරයට අයත් වේ. පරිසර දූෂණය කියන්නේ මිනිසුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවුණු අතුරු ප්‍රතිඵලයකි. අක්‍රමවත්ව, සීමාවන් නොමැතිව එකතු වන කැලිකසළත් පරිසර දූෂණයේ මූලික හේතුකාරකයකි.

ග්‍රාමීය ප්‍රදේශවල නොව නාගරික වටාපිටාවක් සහිත ප්‍රදේශයක මහමගක ඔබ ගමන් කළහොත් කැලිකසළ ගොඩනොගැසුණු තැනක් ඔබට සොයාගත හැකි ද? ඇතැම් නගර ආශ්‍රිතවත්, පාරවල් දෙපසත් ඇති කැලිකසළ වලින් හමන දුගඳ අවලස්සන ගැන ඔබට අමුතුවෙන් කිව යුතු නැත. නිසි පාලනයක් නොමැතිව ගොඩගැසී ඇති කැලිකසළ ගොඩවලට වැසි වතුර ආදිය එකතු වීමෙන්, ඒ තුළින් පෙරී එන ස්‍රාවයන් මගින් මතුපිට හා භූගත ජල සම්පත් දූෂණයවීම නිසා නැවත පිළිසකර කළ නොහැකි අන්දමේ බරපතල පාරිසරික හානි සිදුවිය හැකිය. ඒ වගේම විවෘතව ගොඩගසන අපද්‍රව්‍ය දහනය මගින් ද සෞඛ්‍ය හා පාරිසරික ගැටලු ගණනාවක් ඇති විය හැකිය. කැලිකසළ ගොඩවලට ගිනි තැබීම මේ ප්‍රශ්නයට හොඳම විසඳුම බව ඇතැම් අය සිතති. කොළ, රොඩු වැනි ද්‍රව්‍ය ;මත් නොව, ප්ලාස්ටික්, පොලිතින්, වීදුරු, කඩදාසි, වෙනත් අපද්‍රව්‍ය ගත්විට ඒවා දහනය කිරීම කිසිසේත්ම සුදුසු නොවන බව පරිසරවේදීහු පවසති. මෙමගින් පිටවන අධික දුම මගින් විශාල වායු දූෂණයක් සිදුවන අතර අවසානයේ එය සමස්ත පාරිසරික ක්‍රියාකාරිත්වයට බලපෑ හැකිය. උදාහරණයක් ලෙස පොලිතින් පිළිස්සීමෙන් ඩයොක්සීන් නම් වායුව බාහිර පරිසරයට එකතු වන අතර ඇතැම් ප්ලාස්ටික් වර්ග වලින් පොලික්ලොරෝ බෙන්ඩීන් නම් රසායනයක් ද වේ.

දිරාපත් නොවන කැලිකසළ එක් රැස් වුණු භූමිය නැවත භාවිතයට ගත නොහැකි ලෙස භෞම දූෂණයක් සිදුවන බව පර්යේෂණ මගින් සොයා ගෙන තිබේ. විශේෂයෙන් අපද්‍රව්‍ය ගොඩගසා ඇති විට ඒවා අභ්‍යන්තරයේ ඇතිවන රසායනික ප්‍රතික්‍රියාවන් නිසා පාංශු ජීවීන් විනාශ වන අතරම පෝෂක කොටස් ද මැරී යයි.

කැලිකසළ දැමීමට ඇති පහසුම තැන් විදිහට ඇතැමුන් තෝරා ගෙන තිබෙන්නේ ගංගා, ඇළ දොළ ආදියයි. නමුත් මෙයින් සිදුවන ජල දූෂණය ගැන සිතීමට කිසිවකුත් උනන්දු නොවේ.

පරිසරය කියූ විට එය කෙනෙකුගේ නෙතට ප්‍රිය දසුනක් විය යුතුය. ශ්‍රී ලංකාවේ දැනට පවතින සැලසුම් රහිත කැලිකසළ බැහැරලීමේ ක්‍රම, ශ්‍රී ලංකාව පිළිබඳ අහිතකර ප්‍රතිරූපයන් ඇතිකරලීමට ඉවහල් වන අතර, අප රටෙහි කාර්මික සංවර්ධනයට මෙන්ම සංචාරක ව්‍යාපාරයට ද මෙමගින් අහිතකර ප්‍රතිඵල ගෙන දිය හැකිය.



අප විසින් බැහැරලන කැලිකසළවල වැඩි වශයෙන්ම තිබෙන්නේ උපද්‍රවකාරී අපද්‍රව්‍යයි. මේවායින් සිදුවන පාරිසරික හා සෞඛ්‍ය තර්ජනයට විරාමය තැබිය යුත්තේ අප විසින්මය. ඒ සඳහා කළ යුතුව තිබෙන්නේ කැලිකසළ ක්‍රමවත්ව බැහැර කිරීම හා කැලිකසළ එකතු වන ප්‍රමාණය අවම කිරීමය. කැලිකසළ සම්බන්ධයෙන් අප නිරන්තයෙන් මැසිවිලි නගමින් ඇඟිල්ල දිගුකරන්නේ අන් අය දෙසටය. මෙහි වගකීම කිසියම් ආයතනයකට හෝ පුද්ගලයකු මත පැටවීම නොකළ යුතුය.

ඩෙංගු, පාචනය, බරවා, පිළිකා රෝග, ශ්වසන රෝග, අතීසාරය හේතුවෙන් වාර්ෂිකව අපේ රටේ බොහෝ පිරිසක් මිය යති. නමුත් මීට හේතුව ගෙවත්තේ, හෝ අසල ඇති කැලිකසළ ගොඩ, කාණුව කියලා කිසිවකු හෝ නොසිතයි. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල පැතිරී යන බෝවන රෝගවලට හේතු වී තිබෙන්නේ පාරිසරික අපවිත්‍රතාවයි. කැලිකසළ පිරී කුණු කාණු වලින් බෝවන මැසි මදුරුවන් පිළිබඳ ප්‍රශ්නයෙන් නාගරික ජනතාව නිතැතින්ම පීඩා විඳිති. ඉන්පසු ලෙඩ රෝග වැළඳුණුවිට ප්‍රතිකාර ගැනීමට යාම නිසරදයට කොට්ටය මාරු කරන්නාක් මෙන් නිශ්ඵල ක්‍රියාවකි.

අප මීට පෙර සඳහන් කළ පරිදි කැලිකසළ දහනය කෙතරම් අපේ සෞඛ්‍යයට අහිතකරද යන්නත් ගැඹුරින් විමසා බැලිය යුතුය. මෙමගින් පිටවන සල්ෆඩයොක්සයිඩ්, හයිඩ්‍රජන් සල්පයිඩ්, නයිට්‍රජන් ඔක්සයිඩ් හේතුවෙන් පෙනහළුවල ආසාදන, නිවුමෝනියාව, නිදන්ගත පිළිකා රෝග ඇති වන බව පර්යේෂණ මගින් සොයාගෙන ඇත. එපමණක් නොව මිනිස් මළ සහ ඇතැම් අපද්‍රව්‍ය කොටස් හරියාකාරව බැහැර නොකිරීමෙන් භයානක රෝග හටගත හැකිය. උදාහරණයක් හැටියට මිනිස් අන්ත්‍රයේ සිටින E-Coli නැමති බැක්ටීරියාව මිනිස් මළ මගින් පරිසරයට බැහැරවී යම් හෙයකින් නැවත සිරුරකට එකතු වුවහොත් පාචනය, අතීසාරය වැනි රෝග හටගැනීමට ඉඩ ඇත.

අප විසින් බැහැරලන කැලිකසළවල වැඩි වශයෙන්ම තිබෙන්නේ උපද්‍රවකාරී අපද්‍රව්‍යයි. මේවායින් සිදුවන පාරිසරික හා සෞඛ්‍ය තර්ජනයට විරාමය තැබිය යුත්තේ අප විසින්මය. ඒ සඳහා කළ යුතුව තිබෙන්නේ කැලිකසළ ක්‍රමවත්ව බැහැර කිරීම හා කැලිකසළ එකතු වන ප්‍රමාණය අවම කිරීමය. කැලිකසළ සම්බන්ධයෙන් අප නිරන්තයෙන් මැසිවිලි නගමින් ඇඟිල්ල දිගුකරන්නේ අන් අය දෙසටය. මෙහි වගකීම කිසියම් ආයතනයකට හෝ පුද්ගලයකු මත පැටවීම නොකළ යුතුය. මෙයට අප සියල්ලෝම වගකිව යුතුය. අපේ නිවෙස, ගෙවත්ත ලස්සනට සකසුරුවමට තබා ගන්නට වෙහෙසෙන අපට පරිසරය ගැන සිතන්නට මොහොතක් මිඩංගු කළ නොහැකි ද? මේ කාර්යය අප අතින් හරිහැටි ඉටු වන්නේ නම්, කැලිකසළ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් සොයා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

සටහන - **සකුන්තලා ජයසිංහ**